සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 7 - 2017

නම/විභාග අංකයः-.............................. පුරවැසි අධ්‍යාපනය කාලයः-පැය 02යි

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැනට යොදන්න.

01. තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා පිහිටුවා ගන්නා නිවැරදි වූ ද නිශ්චිත වූ ද අධිෂ්ඨානයන් ............................................ ....................... ලෙස හැඳින්විය හැකිය. (අභිමතාර්ථ/ජීවන අරමුණු/අපේක්ෂාවන්)

02. සමාජයේ පැවැත්මට අවශ්‍ය පුද්ගලයින් බිහිකරන ප්‍රධාන මූලය .............................................................. වේ.

(පවුල/පාසල/පන්සල)

03. ලෝකයේ කිසිම පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක් හා කිසිම ආකාරයකින් .............................................................. නොවේ.

(සමීප/සමාන/දුරස්ථ)

04. වර්තමානයේ පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනාගැනීම සඳහා භාවිතා කරනු ලබන්නේ ............................................... ව්‍යුහය පිළිබඳ පරීක්ෂණයයි.

(ශරීරයේ බාහිර/ශරීරයේ අභ්‍යන්තර/DNA)

05. දරුවන් මැනවින් හික්මවමින් දරුවන්ගේ හැකියා දක්ෂතා විභවතා හඳුනාගනිමින් අවශ්‍ය මග පෙන්වන්නේ ................. .................................................... ය.

(දෙමවුපියන්/ගුරුවරුන්/වැඩිහිටියන්)

- අංක 06 සිට 10 දක්වා වගන්ති හරිනම් (4) ලකුණ ද වැරදි නම් (5) ලකුණ ද වරහන තුළ යොදන්න.

06. ස්වයං විනයෙන් යුතුව කටයුතු කිරීම යහපත් පුරවැසියෙකු සතු ගුණාංගයකි. ( )
07. හොඳින් අධ්‍යාපනය ලැබීම ඔබ සතු අයිතිවාසිකමකි. ( )
08. දෙමාපියන්ගේ රැකියා අහිමිවීම පවුලේ සාමාජිකයින්ට අහිතකර අන්දමින් බලපෑම් ඇති කරයි. ( )
09. වෙළෙඳ පොළේ බඩු මිලදී ගැනීමේදී රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන මිල පාලන ප්‍රතිපත්ති පිළිබඳව අප දැනුවත් වීම අවශ්‍යම නොවේ. ( )
10. හැඬීම, දුක හා සතුට යන චිත්තවේග දෙකටම සිදුවන ප්‍රතික්‍රියාවක් වුවද එම ක්‍රියාවෙහි වෙනසක් දක්නට ලැබේ. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.

**A**



11. A පින්තූරයෙන් දැක්වෙන්නේ ................................................ සිද්ධස්ථානයක ආගමික වතාවක් සිදුකරන අවස්ථාවකි.
12. එහි ආගමික නායකයා වන්නේ ............................................................... වේ.
13. මහනුවර නගරයේ දක්නට ලැබෙන ..................................................... ප්‍රධාන සිද්ධස්ථානයන්ගෙන් එකකි.



B

14. B පින්තූරයෙන් දැක්වෙන්නේ .................................... ආගමික වතාවක් සිදුකරන අවස්ථාවකි.

15.එහි ආගමික ග්‍රන්ථය ........................................ වේ.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. දෙමාපියන් විසින් දරුවන් වෙනුවෙන් ඉටුකරන යුතුකමකි.

(1) දරුවන් ආරක්ෂා කිරීම (2) දරුවන් කියන දේ කිරීම

(3) දරුවන් තමා යන සෑම ගමනකටම සම්බන්ධ කර ගැනීම (4) මිතුරන් ඇසුරු කිරීමට නොදීම

17. ගුරුවරයාගේ කාර්යය වන්නේ

(1) දරුවන් මැනවින් හික්මවීමයි (2) දරුවන්ගේ දක්ෂතා හඳුනා ගැනීමය

(3) අධ්‍යාපනය ලබා දීමය (4) ඉහත සියල්ලමය

18. ආගමික සංවිධානයක් මගින් ඉටුකරන ප්‍රධාන කාර්යයක් වන්නේ

(1) අධ්‍යාපනය ලබා දීම ය (2) සාරධර්ම හුරු කිරීම ය

(3) සහයෝගය වර්ධනය කිරීම ය (4) සේවා සැපයීමය

19. ධීවර කර්මාන්තයේ නියැලෙන අයට වඩාත් වැදගත්ම දෛනික තොරතුර මින් කුමක් ද?

(1) විනිමය අනුපාතය පිළිබඳ දැන ගැනීම (2) කාලගුණ තොරතුරු හා අනාවැකි පිළිබඳ දැන ගැනීම

(3) රාජ්‍ය නිවේදන පිළිබඳ දැන ගැනීම (4) රැකියා තොරතුරු පිළිබඳ දැන ගැනීම

20. ඔබේ දක්ෂතා සහ හැකියා වැඩිදියුණු කර ගැනීමට ඉවහල්වන ක්‍රමයක් වන්නේ මින් කුමක් ද?

(1) රූපවාහිනිය නැරඹීම (2) මිතුරන් ඇසුරු කිරීම

(3) විනෝද ගමන් යාම (4) සෞන්දර්යාත්මක කටයුතුවල නිරත වීම

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 4 කටත් ඇතුළුව මුළු ප්‍රශ්න 5ක් සඳහා පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයේ එක් කොටසක් සඳහා ලකුණු 2 බැගින් 16ක් හිමිවේ.**

01. (i) පවුලක සිටින සාමාජිකයින් අනුව පවුල් වර්ග 2කට බෙදේ. එම පවුල්වර්ග දෙක නම් කරන්න. (ල. 02)

(ii) පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 2ක් ලියන්න. (ල. 02)

(iii) පවුලේ සාමාජිකයෙක් වශයෙන් ජීවත් වීම නිසා අත්වන ප්‍රයෝජන 2ක් ලියන්න. (ල. 02)

(iv) පාසල් ශිෂ්‍යයෙක් වශයෙන් ඔබේ අරමුණ වන්නේ විභාග වලින් විශිෂ්ට ජයක් ලැබීමයි. ඒ සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග 2ක් ලියන්න. (ල. 02)

(v) ඔබ තුළ පවතින යහපත් ගති ලක්ෂණ 02ක් ලියන්න. (ල. 02)

(vi) ඔබ තුළ පවත්නා දුර්වලතා මඟහරවා ගැනීමට ඔබ කටයුතු කරන ආකාර 2ක් ලියන්න. (ල. 02)

(vii) ජන සමාජයේ දක්නට ලැබෙන හිතකර බලවේග 2ක් ලියන්න. (ල. 02)


(viii) අධික කෝපයට පත් වූ පුද්ගලයකු තුළින් දක්නට ලැබෙන ලක්ෂණ 2ක් ලියන්න. (ල. 02)

02. (i) අයහපත් චිත්තවේග තත්ත්වයන් පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න. (ල. 04)

(ii) සතුටින් සිටීම නිසා වලක්වාගත හැකි රෝගී තත්ත්වයන් 2ක් ලියන්න. (ල. 02)

(iii) ඔබ දුකට පත් වූ අවස්ථාවක දක්වන ප්‍රතික්‍රියා 5ක් ලියන්න. (ල. 05)

03. පවුල මුල්කරගෙන සිදුවන අන්තර් සබඳතා පිළිබඳ රූප සටහනක් මෙහි දැක්වේ.




(i) මෙම රූප සටහනේ A හා B වලින් දැක්වෙන හිස්තැනට සුදුසු පිළිතුරු ලියන්න. (ල. 02)

(ii) පවුල තුළ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේ දී දරුවන්ගෙන් ඉටුවිය යුතු කාර්යයන් 4ක් ලියන්න. (ල. 04)

(iii) (අ) අසල්වැසියන් සමග අන්තර් සම්බන්ධතා පවත්වන අවස්ථා 2ක් ලියන්න. (ල. 02)

(ආ) අන්තර් සම්බන්ධතා පැවැත්වීමෙන් වර්ධනය වන ගුණාංග 3ක් ලියන්න. (ල. 03)

04. (i) ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතා සඳහා පිහිටුවාගෙන ඇති විවිධ සංවිධානවල කටයුතු සාර්ථක කරගැනීමට ඔබෙන් ඉටුවිය යුතු කාර්යයන් 2ක් ලියන්න. (ල. 02)

(ii) පහත A හා B තීරු නිවැරදිව යා කරන්න.

| A | B |
|---|---|
| ආගමික සංවිධාන | 1. ග්‍රාම සංවර්ධනයට |
| | 2. ආගම ඉගෙනීම |
| | 3. පොදු සේවා සැපයීම |
| ග්‍රාම සංවර්ධන සමිති | 1. ආධ්‍යාත්මික සංවර්ධනය |
| | 2. සාර ධර්ම හුරු කිරීම |
| | 3. විනය හා ශික්ෂණය |
| ක්‍රීඩා සමිති | 1. ක්‍රීඩා කටයුතු දියුණුව |
| | 2. සහයෝගයෙන් කටයුතු කිරීම |
| | 3. ජයග්‍රහණ හුරු කිරීම |

(ල. 09)

05. (i) ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ඔබට හිමි අයිතිවාසිකම්වල ලක්ෂණ 3ක් ලියන්න. (ල. 03)

(ii) පහත උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

පහළට

1. අසල් වැසියන් සමග දුර්වල සම්බන්ධතා පැවැත්වීමෙන් මෙය ඇති වේ.
3. මිනිසා ප්‍රගුණ කළ යුතු උතුම් මානව ගුණාංගයකි.
6. පුද්ගලයන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයට මෙම ආයතනය ඉවහල් වේ.
7. දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවන කාර්යයකි. ....... ලබාදීම.


හරහට

2. සිවිල් අයිතිවාසිකමකි.
4. ඔබ මේවා පිළිපැදීම සමාජ යහපතට හේතුවේ.

5. සමාජයේ කුඩාම ඒකකය මෙය වේ.

8. අධිතාක්ෂණ යුගයේ භාවිතා වන උපකරණයකි.

(ලකුණු 8)




06. (i) ළමයා සතුවන අයිතිවාසිකම් 3ක් ලියන්න. (ල. 03)

(ii) ළමයන් ශ්‍රමිකයන් වශයෙන් සේවයේ යෙදවීමෙන් සිදුවිය හැකි අසාධාරණකම් 4ක් ලියන්න. (ල. 04)

(iii) සමාජය තුළ ළමයින් යොදවාගෙන ශ්‍රමය ලබාගන්නා අවස්ථා 4ක් ලියන්න. (ල. 04)

07. වර්තමානයේ බොහෝ සාමාජිකයන් මුහුණදෙන අභියෝග අවස්ථා හා එම අභියෝග ජය ගැනීමට කළයුතු ක්‍රියාමාර්ග පහත දැක්වේ. ඒවා වෙන වෙනම තෝරාගෙන වගුව සම්පූර්ණ කරන්න.

1. තරඟකාරිත්වයට මුහුණදීම
2. සමාජය සංකීර්ණවීම
3. ජීවන අරමුණක් හා ඉලක්කයක් ගොඩනගා ගැනීම
4. සාරධර්ම පිරිහීම
5. නිර්මාණශීලී චින්තනය
6. අපචාර බහුලවීම
7. විරැකියාව
8. අසුබවාදී දෘෂ්ටිකෝණයකින් තොරවීම
9. හිතකර බලවේග ලඟාකර ගැනීම
10. තමා කරන කටයුතු පිළිබඳ විශ්වාසවන්තභාවය
11. පාරිසරික ගැටලු

| අභියෝග | ජයගැනීමට කළයුතු ක්‍රියා මාර්ග |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |
| 5. | 5. |
| 6. | |

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 7 - 2017

### පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

#### I කොටස

| | | | |
|---|---|---|---|
| 1. ජීවන අරමුණු | 2. පවුල | 3. සමාන | 4. DNA |
| 5. ගුරුවරුන් | 6. 3 | 7. 5 | 8. 4 |
| 9. 5 | 10. 4 | 11. බෞද්ධ | 12. බුදුන්/බුදුරජාණන් |
| 13. දළදා මාලිගය | 14. ඉස්ලම් | 15. ශුද්ධ වූ අල්කුරානය/අල් කුරානය/ශුද්ධ කුරානය | |
| 16. 1 | 17. 4 | 18. 2 | 19. 2 |
| 20. 4 | | | |

#### II කොටස

01. (i) න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල

(ii) ඥාතීත්වය මත ගොඩ නැගීම. එක් වාසස්ථානයක ජීවත් වීම, සාමාජිකයන් අතර සමීප සම්බන්ධතා පැවැත්වීම ආදරය, කරුණාව, දයාව යන ගුණාංග පදනම් කරගෙන සමීප සම්බන්ධතා පැවතීම.

(iii) නායකත්වයට ගරු කිරීමට හුරු කිරීම, අන්‍ය අදහස් ගරු කිරීමට හුරු කිරීම, සම්ප්‍රදාය හා සිරිත් විරිත් ගරු කිරීමට හුරු කිරීම, ආහාර හා පෝෂණය ලැබීම

(iv) දිනපතා පාසල් යාම, ගුරුවරුන්ට කීකරු වීම, හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරතවීම

(v) ගැළපෙන පිළිතුරට ලකුණු ලබා දෙන්න.

(vi) ගුරුවරුන්ට කීකරු වීම, දෙමාපියන්ට කීකරු වීම, වැනි

(vii) කළණ මිතුරන්, හොඳ පොත්පත්, හොඳ මාධ්‍ය වැඩ සටහන්

(viii) වෙව්ලීම, මුහුණ රතුවීම යනාදී

02. (i) ආගමික කටයුතුවල යෙදීම, ඇවිදීම, කවි ගී ගායනය චිත්‍ර ඇඳීම

(ii) අධික රුධිර පීඩනය, මානසික ආතතිය, මානසික පීඩනය

(iii) හැඬීම, සුසුම් හෙළීම, කතා නොකර සිටීම, ආහාර නොගෙන සිටීම වැනි පිළිතුරු

03. (i) A පියා B මව

(ii) වියපත් වූ විට රැක බලා ගැනීම
පෝෂණය කිරීම
ආදරය කිරීම, අවනත වීම (පිටුව 50)

(iii) (අ) අවමංගල අවස්ථා/මංගල උත්සව අවස්ථා/ශ්‍රමදාන /දානමය කටයුතු//අස්වනු නෙළා ගන්නා වැනි කෘෂිකාර්මික කටයුතු ආදී 2ක් ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ආ) සමගිය/සහෝදරත්වය/සහයෝගය/උදව් කිරීම/කණ්ඩායම් හැඟීම/බෙදා ගැනීම/ආදී කටයුතුවලින් 3ක් (පිටුව 51)

04. (i) සහභාගිත්වය, සම්බන්ධතා පැවැත්වීම

(ii) ආගමික සංවිධාන - ආගම ඉගැනීම, ආධ්‍යාත්මික සංවර්ධනය, සාරධර්ම හුරුකිරීම
ග්‍රාම සංවර්ධන සමිති - ග්‍රාම සංවර්ධනයට පොදු සේවා සැපයීම සහයෝගයෙන් කටයුතු කිරීම
ක්‍රීඩා සංවිධාන - විනය හා ශික්ෂණයට, ක්‍රීඩා කටයුතු දියුණුව, ජය පරාජය හුරු කිරීම

05. (i) සමාජය තුළින්ම හිමිවේ. /අසීමිත නොවී පවතී/යුතුකම් සමග බැඳෙයි (පිටුව 60)

(ii)

| පහළට | හරහට |
|---|---|
| 1. අසහනකාරී | 2. සමානාත්මතාවය |
| 3. ඉවසීම | 4. නීතිරීති |
| 6. පන්සල | 5. පවුල |
| 7. අධ්‍යාපනය | 8. අන්තර්ජාලය |

06. (i) අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය/ආරක්ෂාවට ඇති අයිතිය/සහභාගිත්වයට ඇති අයිතිය/පෝෂණයට ඇති අයිතිය

(ii) සුන්දර ළමා කාලය අහිමි වීම, අපයෝජනයට ලක්වීම, ඉගෙනීමට ඇති අවසථාව අහිමි වීම, ශ්‍රමය සූරා කෑම

(iii) මෙහෙකාර සේවය, වෙළඳාම සඳහා යොදා ගැනීම, ව්‍යාපාර සඳහා ශ්‍රමය යොදා ගැනීම

| 07. අභියෝග | අභියෝග ජය ගැනීමට කළයුතු ක්‍රියා මාර්ග |
|---|---|
| 1. තරඟකාරිත්වයට මුහුණ දීම | 1. ජීවන අරමුණක් හා ඉලක්කයක් ගොඩනඟා ගැනීම |
| 2. සමාජය සංකීර්ණ වීම | 2. නිර්මාණශීලී චින්තනය |
| 3. සාරධර්ම පිරිහීම | 3. අසුබවාදී දෘෂ්ටිකෝණයකින් තොරවීම. |
| 4. අපචාර බහුලවීම | 4. හිතකර බලවේග ළඟාකර ගැනීම |
| 5. විරැකියාව | 5. තමා කරන කටයුතු |
| 6. පාරිසරික ගැටළු | පිළිබඳ විශ්වාසවන්ත භාවය |